මගේ අංකය:- ඊ/11.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක...179......
සියලුම අමාත්‍යාංශවල ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
රාජ්‍ය ~~ව්‍යවස්ථාපිත~~ සංස්ථා ප්‍රධානීන් වෙත.

**විදේශීය ශිෂ්‍යත්ව, සම්මන්ත්‍රණ හා රාජ්‍ය පරිපාලන හා කළමනාකරණය කටයුතු වලට අදාල විදේශ ගමන්.**

රාජ්‍ය පරිපාලනය හා කළමනාකරණය පිළිබඳ විවිධ ක්ෂේත්‍රයන්හි පුහුණුව සඳහා ලැබෙන විදේශාධාර උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා රජය විසින් පහත සඳහන් තීරණයන්ට එළඹ ඇත:-

(අ) මෙම ක්ෂේත්‍රයන්ට අදාළ ශිෂ්‍යත්ව, සම්මන්ත්‍රණ හා විදේශ ගමන් පිළිබඳ කටයුතු ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පාලන මණ්ඩලය විසින් කළ යුතුය.

(ආ) පාලන මණ්ඩලයේ මේ පිළිබඳ කටයුතු රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් සම්බන්ධීකරණය කළ යුතුය.

(ඇ) විදේශීය හා දේශීය පුහුණුව ලබා ඇති ශ්‍රී.ලං.ප.සේ.නිලධාරීන්ගේ සේවය සඵල ලෙස ප්‍රයෝජනයට ගන්නා බව තහවුරු කර ගැනීමේ වගකීම ද පාලන මණ්ඩලයට පැවරිය යුතුය.

යථෝක්ත තීරණයන් ක්‍රියාත්මක කිරීම සඳහා, රාජ්‍ය පරිපාලනය හා කළමනාකරණය පිළිබඳ විවිධ ක්ෂේත්‍රයන්හි විදේශීය ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ හා විදේශ ගමන් සඳහා කෙලින්ම ඔබ අමාත්‍යාංශයට ලැබෙන පිරිනැමීම්, ලැබුණු වහාම, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂට ඉදිරිපත් කරනු මැනවි.

තවද, ඔබ අමාත්‍යාංශයට අනුයුක්තව සිටින ශ්‍රී.ලං.ප.සේ. නිලධාරීන් අතුරෙන් විදේශීය හා දේශීය පුහුණුව ලබා සිටින අයගේ නම් ලැයිස්තුවක්, ඔවුන් ලබා ඇති පුහුණුව පිළිබඳ විස්තර සහිතව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කරනු මැනවි.

Siriwardhana
ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන.
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්.

1980 සැප්තැම්බර් 10 දින.
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය,
28/10, ලොන්ඩන් පෙදෙස,
කොළඹ 07.